(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 1(8).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2010 අගෝස්තු මස 20 වැනි සිකුරාදා**

## 2010 සැප්තැම්බර් මස 07 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

* ජාතික සේවක අධ්‍යයන ආයතන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2010 සැප්තැම්බර් මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0237/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0265/'10

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කඩුගන්නාව, කුරුකුන්තල අංක 18 බී ලිපිනයේ පදිංචි, එස්. එම්. එම්. හලීම් මහතා 1994 ඔක්තෝබර් මස 03 වැනි දින සිට මහ/අල් - මනාර්, මාවනැල්ල සහිරා සහ මැවනැල්ල මයුරපාද යන ජාතික පාසලවල (දුෂ්කර හා දුෂ්කර නොවන) සතුටුදායකව සේවය කළ වාණිජ උපාධිධාරී ගුරුවරයෙකු බවත්;

(ii) හලීම් මහතා දැනට සේවය කරන මාවනැල්ල සහිරා ජාතික පාසලේ රාජකාරියට වාර්තා කිරීමට එම පාසලේ විදුහල්පතිවරයා බාධා කරන බවත්;

(iii) එම විදුලහල්පතිවරයා බාහිර පුද්ගලයන් යොදවා පාසල තුළදී හලීම් මහතාට පහරදී ජීවිත තර්ජනයක් කර ඇති බැවින් එම පාසල තුළ ඔහුට නිදහසේ සේවය කිරීමට නොහැකි වාතාවරණයක් උද්ගතව ඇති බවත්;

(iv) ඒ අනුව ඔහු මාවනැල්ල මයුරපාද ජාතික පාසලට ස්ථාන මාරුවීමක් ඉල්ලා ඇති බවත්;

(v) එම ඉල්ලීම හිතාමතාම නිර්දේශ නොකරමින් ඉහත විදුහල්පතිවරයා තවදුරටත් හලීම් මහතා මානසික පීඩාවට පත් කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විදුලහල්පතිවරයාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් පවත්වන්නේද;

(ii) හලීම් මහතාට මාවනැල්ල මයුරපාද ජාතික පාසලට ස්ථාන මාරුවීමක් ලබාදීමට නොපමාව පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0299/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ලබා ගත් අවසරයක් මත ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්ව තිබූ, කොළඹ 02 වොක්ෂෝල් පටුමගෙහි අංක 53/75 දරන ස්ථානයේ පිහිටි පර්චස් 100 ක පමණ වූ ඉඩම් කොටස රුපියල් මිලියන 300 කට විකුණා ඇති බවත්;

(ii) මෙම ඉඩම විකිණීමට අමාත්‍ය මණ්ඩල අවසරය ලබාගත්තේ ජනවසම සේවකයින්ගේ සහ නිලධාරීන්ගේ හිඟ අර්ථසාධක අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු මුදල් හා පාරිතෝෂික ගෙවීම සඳහා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අර්ථසාධක අරමුදල් ගෙවා නිම කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය;

(ii) ඉහත සඳහන් රුපියල් මිලියන 300 යෙන් අර්ථසාධක වශයෙන් ගෙවූ මුදල් ප්‍රමාණය;

(iii) අර්ථසාධක වශයෙන් තවදුරටත් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය පසුගිය වර්ෂයේදී අලාභ ලැබුවේද;

(ii) එසේ අලාභ ලැබීමට හේතුව කුමක්ද;

(iii) එසේ නම්, එම වර්ෂයේ අලාභය සහ මෙම වර්ෂයේ මැයි මස දක්වා ලාභය හෝ අලාභය කොපමණද;

(iv) ආයතනය අලාභ ලැබීම අර්ථසාධක අරමුදල් නොගෙවීමට හේතු වීද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0316/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉන්දු - ලංකා නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

(ii) පසුගිය වර්ෂ දහය තුළදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සිදු කරන ලද ආනයන සහ අපනයන පිළිබඳ වෙළඳ සංඛ්‍යා දත්ත කවරේද ;

(iii) "සීපා" ගිවිසුමෙහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) "සීපා" ගිවිසුම සම්බන්ධව රජයේ ස්ථාවරය කවරේද;

(v) "සීපා" ගිවිසුම අත්සන් කිරීමට නියමිතද;

(vi) "සීපා" ගිවිසුම සම්බන්ධයෙන් ඉන්දියාව සමඟ සාකච්ඡා පවත්වන පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0349/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010 අයිෆා සම්මාන උළෙල සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය මගින් දැරූ වියදම කොපමණද;

(ii) පෞද්ගලික සමාගම් විසින් මෙම උත්සවය සඳහා සංචාරක මණ්ඩලයට ලබා දුන් සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම මුදල් ලබා දුන් සමාගම්වල නම් සහ එක් එක් සමාගම ලබාදුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම උත්සවයට සහභාගීවීම සඳහා පැමිණීමට අනුමතිය ලබා දුන් නළු නිළියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන්ගෙන් ශ්‍රී ලංකාවට පැමිණි සංඛ්‍යාව සහ පැමිණි අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0366/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන් අනුව වෛද්‍යවරුන් සහ ජනතාව අතර පැවතිය යුතු අවම අනුපාතය කුමක්ද;

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගන්නා ප්‍රමිතීන් අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සහ ජනතාව අතර තිබිය යුතු අවම අනුපාතය කොපමණද;

(iii) දැනට ශ්‍රී ලංකාව තුළ පවතින වෛද්‍යවරුන් සහ ජනතාව අතර අනුපාතය කොපමණද;

(iv) මධ්‍යම රජයේ පාලනය යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) පළාත් සභා යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් පිටවන වෛද්‍යවරුන් රජයේ සේවයට බඳවා ගැනීම නතර කිරීමට හෝ සීමා කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0409/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ ගණනාවක සිට ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වෙමින් තිබූ ඉහළ කොත්මලේ විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේ කවදාද;

(ii) එයින් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට බලාපොරොත්තුවන මෙගාවොට් ප්‍රමාණය කොපමණද;

(iii) මේ සඳහා වැය වන සම්පූර්ණ මුදල කොපමණද;

(iv) මෙම බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කිරීම නිසා රටට සිදු වූ ආර්ථික අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0238/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0320/'10

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් හමුවීමට ඇති ඉඩකඩ කවරේද;

(ii) තෙල් ගවේශනයට අදාළ කැනීම් කටයුතු ආරම්භ කිරීමට නියමිත කාල සීමාව කවරේද;

(iii) කැනීම් කටයුතු භාර දී ඇති සමාගම් / රටවල් කවරේද;

(iv) ඉහත පාර්ශවයන් තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් මගින්ද නැතහොත් සාකච්ඡා මාර්ගයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ ප්‍රදේශ දැක්වෙන සිතියමක් ද සහිතව තෙල් හමුවීමට ඉඩ ඇතැයි අනුමාන කෙරෙන ප්‍රදේශ කවරේද;

(ii) තෙල් වලින් අපේක්ෂිත ආදායම අයිතිවන්නේ මධ්‍යම රජයටද; පළාත් රජයටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0365/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා පිඟන් සංස්ථාව යටතේ ඇති උළු හා ගඩොල් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කර්මාන්තශාලාවේ සේවය කරන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බිංගිරිය උළු හා ගඩොල් කර්මාන්ත ශාලාවේ සේවකයින් වෙනුවෙන් මේ දක්වා සේවක අර්ථසාධක අරමුදල් බැර කර තිබේද;

(iv) එම කර්මාන්ත ශාලාවේ සේවය කර විශ්‍රාම ගිය සේවකයින් සඳහා අර්ථ සාධක අරමුදල් ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2007 වර්ෂයේදී වැඩි කළ ජීවන අංක දීමනාව මේ දක්වා සම්පූර්ණයෙන් ගෙවා තිබේද;

(ii) නොඑසේ නම්, එම දීමනාව ලබා දෙන්නේ කවදාද;

(iii) සාධාරණ වන්දි ක්‍රමයක් මත ඔවුන්ට සේවයෙන් ඉවත්වීමට අවස්ථාව සලසා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0367/’10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පානදුර, කේතුමතී කාන්තා රෝහලට සහ අධිකරණ සංකීර්ණයට යන ශ්‍රී මහා විහාර පාර දැනට වර්ෂ 2 ක පමණ සිට දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) එකී මාර්ගය අලුත්වැඩියා කිරීම ප්‍රමුඛතාවය දිය යුතු කරුණක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම මාර්ගය පිළිසකරකිරීම ආරම්භ කරන දිනය හා එය අවසන් කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

(ii) එකී මාර්ගය පිළිසකරකිරීම මෑතක දී ආරම්භ නොකරන්නේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0239/’10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0324/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සිගරට් පරිභෝජනය තුරන් කර දැමීම 'මතට තිත' වැඩසටහනට ඇතුළත් කර තිබේද;

(ii) පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකාවේ සිගරට් සහ බීඩි පරිභෝජනය වාර්ෂික පදනමින් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 6 තුළ දේශීය වශයෙන් නිපදවන ලද සිගරට් සහ බීඩි ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පසුගිය වර්ෂ 6 තුළ රටට ආනයනය කරන ලද සිගරට් ප්‍රමාණය කොපමණද;

(v) දේශීය වශයෙන් නිෂ්පාදිත හා ආනයනික සිගරට් මත බදු පැනවීමෙන් පසුගිය වර්ෂ හය තුළ උපයා ගන්නා ලද ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0368/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ශ්‍රී ලංකාවේ තුන්වන දූෂිත ආයතනය වන බවට ප්‍රකාශ කළ වග එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම දූෂණ සිදුව ඇති බවට චෝදනා ඉදිරිපත් කිරීමට පදනම් කර ගත් මූලාශ්‍රය කුමක්ද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළ සිදුවී ඇතැයි කියනු ලබන දූෂණ කවරේද;

(iii) එම දූෂණ සඳහා වගකිව යුතු පුද්ගලයින්ගේ නම් සහ ඔවුන් දරන තනතුරු කවරේද;

(iv) එම දූෂණ ක්‍රියා සම්බන්ධ තැනැත්තන්ට එරෙහිව අපරාධ පරීක්ෂණ ආරම්භ කර තිබේද;

(v) එසේ නම්, ඒ කවර තැනැත්තන්ට එරෙහිවද;

(vi) එසේ නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දූෂණ චෝදනාවන්ට අදාළව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් කොපමණ සංඛ්‍යාවකට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන්ගේ නම් කවරේද;

(iii) එසේ විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0386/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය සඳහා නවතම ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(ii) එම මුදල් ලබාගන්නේ ණයක් ලෙසද; ආධාරයක් ලෙසද;

(iii) එම ණය හෝ ආධාර ලබා දෙන ආයතන මොනවාද;

(iv) එම මුදල් ලබා ගන්නේ ණයක් ලෙස නම්, එය ගෙවා නිමකළ යුතු කාල සීමාව කොපමණද;

(v) ඒ වෙනුවෙන් ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය අවසන් කරනු ලබන්නේ කවදාද;

(ii) මේ සඳහා පරිසර තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(iii) එසේ නම්, එය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 සැප්තැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0240/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) මෙම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0318/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ රජය, පළාත් සභා හෝ අනෙකුත් කවර හෝ පළාත් පාලන ආයතනයක් විසින් ඉන්දියාව සහ චීනය සමඟ අත්සන් කළ සියලුම කොන්ත්‍රාත් ගිවිසුම් වල නම් කවරේද;

(ii) එළඹෙන වර්ෂය තුළ ඉහත සඳහන් රටවල් සමඟ අත්සන් කිරීමට බලාපොරොත්තුවන ගිවිසුම් තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(iii) ඉහත (i) හි දක්වා ඇති කොන්ත්‍රාත්තුවල සමස්ත පිරිවැය කවරේද;

(iv) එම පිරිවැය දැරීම සඳහා ආදායම් උපයාගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එවැනි ගිවිසුම්වලට එළඹෙන ලද්දේ ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීමෙන් හෝ සාකච්ඡා කිරීමෙන් අනතුරුවද;

(ii) ටෙන්ඩර් කැඳවූයේ නම්, ලැබුණු ටෙන්ඩර් ප්‍රමාණය සහ ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) එය සාකච්ඡා පදනමක් මත සිදුවන්නේ නම් දේශීය පාර්ශ්වකරුවන්ගේ නම් කවරේද;

(iv) නියෝජිතවරුන්ට කොමිස් වශයෙන් ගෙවන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0369/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂ තුළ පැවැත්වූ නීති ප්‍රවේශ විභාගයෙන් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් කරගනු ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂවලදී ඇතුළත් කරගත් දිනයට වයස අවුරුදු 35ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා නීති විද්‍යාලයේ අවසාන වසරේ ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂවලදී, ඇතුළත් කරගත් දිනයට වයස අවුරුදු 35 ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලවල නීතිවේදී උපාධිධාරීන්ගෙන් 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂ තුළ නීති විද්‍යාලයේ ප්‍රථම වසරේ ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් වර්ෂවලදී, ඇතුළත් කරගත් දිනයට වයස අවුරුදු 35 ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0387/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 6 ක කාලය තුළ රෝහල්වලින් ඉවත් කළ බාල වර්ගයේ ඖෂධ ප්‍රමාණය කොපමණද;

(ii) එසේ ඉවත් කරන ලද ඖෂධවල වටිනාකම කොපමණද;

(iii) එම ඖෂධ ගෙන්වීමට අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(iv) එම ඖෂධ විනාශ කිරීමට රජය විසින් මුදලක් වැය කළේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) බාල වර්ගයේ ඖෂධ ගෙන්වීමෙන් සමස්තයක් ලෙස රජයට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0411/'10

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර හන්තාන වත්තෙන් අක්කර 45 රූඩ් 02 පර්. 16ක බිම් ප්‍රමාණයක් නීත්‍යානුකූල නොවන ඉඩම් හුවමාරුවක් ලෙස ෂාමිනී කිරිඇල්ල සහ පිලිප් ජයවර්ධන යන අය වෙත ලබා දී ඇති බව එතුමා දන්වන්නෙහිද;

(ආ) මෙම ඉඩම ලබාදිය හැක්කේ ව්‍යවස්ථාපිතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගෙන වුවත්, එම ක්‍රියා මාර්ගය අනුගමනය නොකර එවකට සිටි අමාත්‍යතුමා සහ ජ.න.ව.ස.ම සභාපතිතුමා විසින් එම ඉඩම පවරා ඇත්තේ නීත්‍යානුකූල නොවන ආකාරයකට බව එතුමා පිළිගන්නෙහිද;

(ඇ) (i) නීත්‍යානුකූලව පවරා නොමැති නම්, මෙම ඉඩම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) නීත්‍යානුකූල නොවන මෙම ඉඩම් ගණුදෙනුවට වගකිව යුත්තෝ කවුරුන්ද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0422/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය අවසන් වන විට ගණනය කරන ලද විදුලිය බෙදාහැරීම් පද්ධති හානි ප්‍රතිශතය කොපමණද;

(ii) ඒ අතුරින් තාක්ෂණික හානි ප්‍රතිශතය හා තාක්ෂණික නොවන හානි ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි අගය 2008 වර්ෂය අවසානයේ අගය හා සන්සන්දනයේදී ප්‍රතිශතය අඩුවීමක්ද, නැතහොත් වැඩිවීමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පද්ධති හානි අවම කිරීම සඳහා මෙතෙක් ගනු ලැබූ සාර්ථක පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0241/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0321/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අතීතයේ සිදුවූ සිද්ධීන් සලකා බැලීම සඳහා ප්‍රතිසන්ධාන මණ්ඩලය හෝ කොමිෂන් සභාව පත් කළ දිනය කවරේද;

(ii) ඉහත සඳහන් කොමිෂන් සභාවේ හෝ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් කොමිෂන් සභාවේ හෝ මණ්ඩලයේ වාර්තාව බලාපොරොත්තු වන දිනය කවරේද;

(iv) කොමිෂන් සභාව / මණ්ඩලය අද වන විට රැස් වී ඇති වාර ගණන කවරේද;

(v) මෙම කොමිෂන් සභාවේ / මණ්ඩලයේ පවත්වාගෙන යෑම සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) එම වෙන් කරන ලද මුදල් ප්‍රමාණය ඒ සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0370/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බණ්ඩාරගම (විවිධ සේවා) සමූපකාර සමිතියේ වර්ෂ 2002 සිට 2010 දක්වා කාලය තුළ සභාපති ධුර දැරූ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) 2002 සිට 2010 දක්වා වර්ෂවල එකී විවිධ සේවා සමූපකාර සමිතියේ ලාභ/ අලාභ වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එකී සමූපකාර සමිතියේ ප්‍රාදේශික කාරක සභා සඳහා නිලවරණය පැවැත්විය යුතු දිනය කවරේද;

(ii) නියමිත දිනට පැවැත්විය යුතු නිලවරණය කල්තැබීම සඳහා නියමකර ඇත්තේද;

(iii) එසේ නම්, කල්තබන ලද දිනය කවරේද;

(iv) එම නිලවරණය, එලෙස කල්තැබීමට හේතුව කුමක්ද;

(v) එම නිලවරණය සඳහා නාමයෝජනා කැඳවන ඉදිරි දිනය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ 3 ක කාලය තුළ එකී සමිතියේ සිදුවී ඇති වංචා හෝ දූෂණ ක්‍රියා පිළිබඳ වාර්තා වී ඇත්තේද;

(ii) එසේ නම්, ඒවාට සම්බන්ධ පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) එම වංචා/දූෂණවල ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ට එරෙහිව දැනට ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0388/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට වරාය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ නවතම ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල් ලබා ගන්නේ ණයක් ලෙසද; ආධාරයක් ලෙසද;

(iii) එම ණය හෝ ආධාර ලබා දෙන ආයතනවල නම් කවරේද;

(iv) එම මුදල් ලබා ගන්නේ ණය මුදලක් ලෙස නම්, එය ගෙවා නිමකළ යුතු කාල සීමාව කොපමණද;

(v) ඊට ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතය කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය අවසන් වන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0423/’10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරයේ දහනය කිරීම සඳහා අවශ්‍ය ගල් අඟුරු ආනයනය කරනු ලබන රටවල්වල නම් කවරේද;

(ii) ගල් අඟුරු දහනයෙන් නිපදවෙන අළු අපවිත්‍ර දුමාරයෙන් ඉවත් කිරීමට යොදා ඇති පිළියම් කවරේද;

(iii) අපවිත්‍ර දුමාරයේ අඩංගු ගෙන්දගම් හා සල්ෆඩයොක්සයිඩ් ඉවත් කිරීමේ යාන්ත්‍රණය කවරේද;

(iv) පිරිසිදු කරන ලද දුමාරය වාතයට මුදාහරින චිමිනියේ උස මීටර් කොපමණද;

(v) පවිත්‍රකරණය අවසානයේ මුදාහරිනු ලබන දූමාරයේ පවත්වා ගැනීමට අපේක්ෂිත සංඝටක සංයුතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බලාගාරයේ සිසිලන ක්‍රියාවලි සඳහා ජලය සපයා ගන්නේ කෙසේද;

(ii) බලාගාරයේ තුළුමුවත් හා පිටමුවත්වල ගන්නා ජල උෂ්ණත්ව වෙනස සෙල්සියස් අංශක කොපමණද;

(iii) බලාගාරයෙන් පිටකරන උණුසුම් ජලය මුහුදු ජලජ ජීවීන් කෙරේ ඇති කළ හැකි අහිතකර බලපෑම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0242/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0323/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රජය "මතට තිත" වැඩසටහන ඇරඹූ දිනය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ දක්වා වූ පසුගිය වර්ෂ දහයක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) බියර් සහ සැර මත්පැන් පරිභෝජනය වෙන වෙනම කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද බියර් සහ සැර මත්පැන් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාව ආනයනය කරන ලද බියර් සහ සැර මත්පැන් ප්‍රමාණය කොපමණද;

(iv) බියර් සහ සැර මත්පැන් ආනයනයේදී සහ දේශීයව නිෂ්පාදනය කිරීමේදී පනවනු ලබන සියලු ආකාර බදු වලින් රජය උපයන ලද මුළු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාව තුළ සිදුවන නීති විරෝධී මත්පැන් පෙරීම මගින් නිපදවනු ඇතැයි ගණන් බලා ඇති මත්පැන් ප්‍රමාණය පසුගිය වර්ෂ තුන තුළදී කොපමණ ප්‍රමාණයක් වීද යන්න වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0424/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැනට ක්‍රියාත්මක ජීව ඉන්ධන බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එකී බලාගාර පිහිටි ස්ථාන කවරේද;

(iii) එකී බලාගාරවලින් ජනනය කෙරෙන මුළු විදුලි ඒකක ගණන මෙගාවොට් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජීව ඉන්ධන බලාගාර, නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ පිළියමක් ලෙස යොදා ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ස්ථානවලද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0440/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා මහජන ඉඩම් පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ බිහිවන ඍජු හා වක්‍ර රැකියා ප්‍රමාණය කොපමණද;

(ii) මේ සඳහා පරිසර තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(iii) එසේ නම්, එය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 සැප්තැම්බර් මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0126/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පොල් සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනුයේ කලාප 6 ක් යටතේ බව එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 ක්, මෙම කලාප 6 හි නිලධාරීන් විසින් ආවරණය කිරීම තුළ පොල් ගොවීන්ගේ අවශ්‍යතාවයන් නිසියාකාරව ඉටුවන්නේ යැයි එතුමා සෑහීමකට පත්වන්නේද?

(ඇ) මෙම නිලධාරීන් හමුවිය හැක්කේ බදාදා පමණක් වන බැව් එතුමා දන්නෙහිද?

(ඈ) මෙම දිස්ත්‍රික්කයේ පොල් වගා කිරීමේ ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට එම තත්ත්වය බාධාවක් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඉ) මෙම ගැටලු විසඳාලීම පිණිස හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා දැනට අනුමතවී ඇති කලාප 6, කලාප 10 ක් තෙක් වැඩි කිරීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0216/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0284/'10

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1978 - 1988, 1989 - 1994, 1995 - 2009 සහ 2010 සිට මේ දක්වා, යන කාල පරිච්ඡේද තුළ දී රජය විසින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද යන්න වාර්ෂික පදනමින් සහ දිස්ත්‍රික් පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිකිරීමට නියමිත නිවාස සංඛ්‍යාව වැඩිකිරීම පිණිස ගැනීමට අදහස් කරන පියවර කවරේද;

(ii) නිවාස ඉදිකිරීම සඳහා මුදල් සපයාගන්නා ප්‍රභවයන් මොනවාද සහ අවශ්‍යතාව ඇති ජනතාව අතර මුදල් බෙදා දෙනු ලබන්නේ කුමන ආකාරයටද;

(iii) නිවාස හිමි සමාජයක් ඇති කිරීම උදෙසා ගැනීමට නියමිත පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0327/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 සහ 2009 වර්ෂයන් තුළ, ශ්‍රී ලංකා රේගුව මගින් අත්අඩංගුවට ගන්නා ලද නීත්‍යානුකූල නොවන බඩු භාණ්ඩ වෙනුවෙන් අදාළ නිලධාරීන් වෙත ලබාදී ඇති ත්‍යාග සහ දීමනාවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(ii) එම ත්‍යාග සහ දීමනා ලබා ගත් නිලධාරීන් කවුරුන්ද;

(iii) අදාළ නිලධාරීන් වෙත ත්‍යාග සහ දීමනා ලබාදීමට හේතු වූ සිද්ධීන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරීන් වෙත ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0355/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා නීතිවිද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා අයදුම් කළ හැකි උපරිම වයස අවුරුදු 35 ක් විය යුතු බවට රීතියක් පනවන ලද්දේද;

(ii) එය ගැසට් පත්‍රයේ පළ කරන ලද්දේ නම්, එහි පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම රීතිය අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනය කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ උපරිම වයසක් නියම කිරීම සඳහා අවශ්‍යතාවයක් තිබේද;

(ii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට හා රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මයන්හි 27(2)(ඌ) ව්‍යවස්ථාවට පටහැනි නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ, ශ්‍රී ලංකා විවෘත හා විදේශ විශ්වවිද්‍යාලවල නීතිවේදී (එල්.එල්.බී) උපාධිධාරීන්ට ශ්‍රී ලංකා නීතිවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා උපරිම වයසක් නියම කර තිබේද;

(ii) නොඑසේ නම්, නීතිවිද්‍යාල ප්‍රවේශ විභාගයට අදාළව පමණක් වයස් සීමාවක් පැනවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත නීතිවිද්‍යාල ප්‍රවේශ විභාගයට අයදුම් කිරීම සඳහා වයස් සීමාවක් පැනවීමෙන් වළකින ලෙස නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7(අ) වගන්තිය ප්‍රකාර නියමයක් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් , ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0371/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1990 ඔක්තෝබර් මස 31 වැනි දිනය වන විට, උතුරු පළාතේ, යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන

දිස්ත්‍රික්කවලට අයත් මුස්ලිම් ජනතාවගේ විවාහ ලියාපදිංචි කිරීම සඳහා එවකට පත්කරනු ලැබ සිටි මුස්ලිම් විවාහ ලේකම්/රෙජිස්ට්‍රාර්වරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ, එම පත්වීම් කරනු ලැබූ අවස්ථාවේදී, ඔවුන් නියෝජනය කරන ලද මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාසය හෝ බල ප්‍රදේශය කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0406/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති;

(i) පර්චස් 4 ට අඩු බිම් ප්‍රමාණයක පිහිටි අඩු පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) අඩු පහසුකම් සහිත අනවසර නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) අනවසර නිවාස පිහිටි මුළු භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම අඩු පහසුකම් සහිත නිවාස, පහසුකම් සහිත නිවාස බවට පත්කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0408/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ දෙසැම්බර් සිට 2010 වර්ෂයේ අප්‍රේල් මස දක්වා වූ කාලය තුළ දිවයින තුළ අලුතින් ආරම්භකළ විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අලුතින් ආරම්භ කළ විදුලි බලාගාර මොනවාද;

(iii) ඒවා පිහිටි දිස්ත්‍රික්ක කවරේද;

(iv) මෙසේ අලුතින් විදුලිබලාගාර ඇතිකිරීම තුළින් ජාතික විදුලි බල පද්ධතියට එක් කිරීමට බලාපොරොත්තු වන මෙගාවොට් සංඛ්‍යාව කොපමණද;

(v) අලුතින් ආරම්භ කර ඇති විදුලි බලාගාර සඳහා ඇස්තමේන්තුගත වියදම එක් එක් බලාගාරය සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

ගරු දිළුම් අමුණුගම මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේ ද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0315/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුලින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0328/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත්වීමට අවශ්‍ය සුදුසුකම් කවරේද;

(ii) එම පත් කිරීම් කිරීමට බලය ඇති පුද්ගලයා හෝ පුද්ගලයන් කවුරුන්ද;

(iii) එක් වර්ෂයක් තුළ පත් කළ හැකි ජනාධිපති නීතිඥයින් සංඛ්‍යාව කොපමණද;

(iv) 1994 සිට මේ දක්වා පත් කර ඇති ජනාධිපති නීතිඥයින්ගේ නම් සහ වයස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0357/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පානදුර මූලික රෝහලේ තිබෙන,

(i) වාට්ටු සංඛ්‍යාව කොපමණද;

(ii) රෝගීන් සඳහා වූ ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 මැයි මස ඇතිවූ වර්ෂාව හේතුවෙන් ශල්‍යාගාරද ඇතුළත්ව වාට්ටු දෙකක් හැර අනෙක් සියලු වාට්ටු ජලයෙන් යටවූ බවත්;

(ii) මෙම බරපතල තත්ත්වය පසුගිය වර්ෂ කිහිපය තුළම වර්ෂයකට කිහිපවරක් ඇතිවූ බවත්;

(iii) එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා වහාම පියවර ගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඒ සඳහා ගන්නා පියවර කවරේද;

(ii) එම කටයුතු කොපමණ කාලයක් තුළ අවසන් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0225/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0344/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 දිනට හිමිකම් ලබමින් සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2009 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2009 දක්වා කාලසීමාවේදී පඩුවස්නුවර නැගෙනහිර හා බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සමෘද්ධිලාභීන්ව සිට ඉවත් කරන ලද අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම පුද්ගලයන් ඉවත්කරන ලද පදනම කුමක්ද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකහි සමෘද්ධිලාභීන් ලෙස අලුතින් එක් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 සැප්තැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0046/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රට තුළ ඇති ලියාපදිංචි ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) බෞද්ධ විහාර, ක්‍රිස්තියානි පල්ලි, හින්දු කෝවිල් සහ මුස්ලිම් පල්ලි සංඛ්‍යාව දිස්ත්‍රික් පදනම මත, වෙන වෙනම කොපමණද;

(iii) එක් එක් ආගමට අයත් ලියාපදිංචි පූජකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (i), (ii) සහ (iii) ප්‍රශ්න වලට අදාල ආයතනවල සහ පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කී ආයතන වලට පසුගිය අවුරුදු 5 තුළ ප්‍රදානය කරන ලද මුදල් ප්‍රමාණය, වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0053/'10

ගරු රාජීව විජේසිංහ මහතා,—මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රාජ්‍ය නොවන සංවිධානවලට සහ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කර ඇති සමාජ සේවා කටයුතුවල යෙදෙන ආයතනවලට ලැබෙන විදේශ අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී ඇති සමාජ සේවා හෝ පර්යේෂණ හෝ උපදේශන කටයුතුවල යෙදෙන සමාගම්වලට ලැබෙන විදේශ මුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(iii) මෙම සමාගම් නීතියෙන් නියමකර ඇති පරිදි තම ලැබීම් ඉදිරිපත් කරන්නේද, බදු ලිපිගොනු පවත්වාගෙන යන්නේ ද සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් මත බදු ගෙවීම කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1999 සහ 2010 අතර වර්ෂ 2010 ඇතුළත් කාලසීමාව තුළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බාහිර මූලාශ්‍රවලින් ලැබුණු අරමුදල් සහ එම අරමුදල් භාවිතා කළ කාරණා කවරේද;

(ii) මෙම අරමුදල් ලබාගත් හේතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළේද;

(iii) මෙම අරමුදල් භාවිතා කිරීම ආණ්ඩුවේ කිසියම් නියෝජිතායතනයක් මගින් අධීක්ෂණය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0082/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිගාතැන්න ග්‍රාම නිලධාරී වසමේ, තාරපේරිය කන්ද, උඩුගල්මොටේ මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණය මේ වන විට සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0214/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0277/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විදේශ රැකියා නියුක්තිය, විදේශ රැකියා නියුක්තිය සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සහ සංක්‍රමණික සේවකයන්ගේ ශුභ සාධනය යන විෂයයන් යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ගැසට් පත්‍රයේ පළ කොට ඇති බවත්;

(ii) ඉහත විෂයයන් පිළිබඳව කටයුතු කළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් ලෙස ලැයිස්තුගත කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනය යෞවන කටයුතු අමාත්‍යාංශය යටතට නොගෙන, විදේශ රැකියා නියුක්තිය යන විෂයට අදාළ කටයුතු ප්‍රමාණවත් අයුරින් ඉටු කිරීමටත්;

(ii) විදේශ රැකියා නියුක්තිය සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීමේ කටයුතු ප්‍රමාණවත් අයුරින් ඉටු කිරීමටත්;

(iii) සංක්‍රමණික සේවකයන්ගේ ශුභ සාධනය පිළිබඳ ප්‍රමාණවත් අයුරින් සොයා බැලීමටත්;

එම අමාත්‍යාංශයට හැකියාව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ සඳහා සුදුසු යෝජනා එතුමා ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0294/10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1991.08.25 දින ලංගම ජනතාකරණය කිරීමෙන් පසු 2002 වර්ෂය දක්වා විශ්‍රාම ගිය සේවකයන්ට මුල් පත්වීමේ දින සිට පාරිතෝෂික ගෙවීමට ශ්‍රී ලංගමය බැඳී සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මුල් පත්වීමේ දින සිට ඔවුන්ට පාරිතෝෂික ගෙවීමට නොහැකි බවට ශ්‍රී ලංගමය අධිකරණ තීන්දුවක් ඉල්ලා සිටියේද;

(ii) එම අධිකරණ තීන්දුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කම්කරු කොමසාරිස්වරයා විසින් එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවන ලෙස උපදෙස් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ විශ්‍රාමික සේවකයින් කී දෙනෙකු සඳහාද;

(iii) ගෙවීමට ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) එම මුදල් කඩිනමින් ගෙවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0347/10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පැල්පත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පැල්පත් නිවසේ හිමිකරුගේ / පදිංචි පවුලේ ප්‍රධානියාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) ඉහත නිවාසයන් හි පදිංචි අනුපවුල්වල ප්‍රධානීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එක් එක් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0354/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) (276 වැනි අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ නීතිවිද්‍යාලයේ කටයුතුවලට අදාළ රීති පැනවිය හැකි බවත්;

(ii) පනතේ 7(1) වගන්තිය ප්‍රකාරව රීති පැනවීම සඳහා අධිකරණ ඇමතිවරයාගේ අනුමතිය අවශ්‍ය වන බවත්;

(iii) පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව රීති ගැසට් කිරීමෙන් පසුව හැකි ඉක්මනින් "අනුමත කිරීම" සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නීති අධ්‍යාපන සභාව වෙත ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ ලිඛිත නියමයන් නිකුත් කිරීමට අධිකරණ ඇමතිවරයෙකුට එම පනතේ 7(අ) වගන්තිය ප්‍රකාරව බලය ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම බලය සුදුසු අවස්ථාවක ක්‍රියාත්මක කිරීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0124/10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ දැනට ක්‍රියාත්මක වන මුළු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩලයන්හි සිටිය යුතු වෛද්‍යවරු, හෙදියන්, සාත්තු සේවිකාවන්, කම්කරුවන් සහ අනෙකුත් ශ්‍රේණිවල නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද:

(iii) දැනට එම රෝහල්හි සේවය කරන ඉහත එක් එක් තනතුරුවලට අදාළ කාර්යය මණ්ඩල සමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම රෝහල්වල කාර්යය මණ්ඩලයන්හි පුරප්පාඩු පවතී නම්, ඒවා සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළද;

(vi) එම රෝහල්වල අතිරික්ත කාර්ය මණ්ඩලයක් සිටී නම්, ඔවුන් කුමන කාර්යයක් සඳහා යොදවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ග්‍රාමීය ප්‍රදේශවල රෝගීන් සැතපුම් 10ක පමණ දුර ගෙවා රෝහල් කරා පැමිණෙන බැව් එතුමා දන්නෙහිද?

(ඇ) ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය නගාලීම සඳහා ජංගම සෞඛ්‍ය සේවා ආරම්භ කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) ඒ තුළින් ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය නගාලීමට හැකිවන බැව් එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0215/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0274/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) නමැති සංවිධානයක් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සංවිධානය විදේශ අරමුදල්වල ප්‍රයෝජන ලබා තිබේද;

(ii) එසේ නම්, පසු ගිය දශකය තුළ, එක් එක් වර්ෂයේදී ලැබූ මුදල් ප්‍රමාණයන් කොපමණද;

(iii) එසේ ලැබුණු විදේශ අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඒවාද;

(iv) 2008 සහ 2009 වර්ෂවලදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි අනුබද්ධිත සංවිධානවල වියදම්වලින් විදේශ අරමුදල් විසින් දරන ලද කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සංවිධානය හෝ එහි සේවකයින්ගෙන් කිසිවකු ශ්‍රී ලංකාවේදී බදු ගෙවිය යුතුව තිබේද;

(ii) එසේ නම්, ඔවුන් ඒ පිළිබඳව සිය වගකීම ඉටු කර තිබේද;

(iii) මෙම සංවිධානයේ අධ්‍යක්ෂවරුන් සහ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ලබාගෙන ඇති වැටුප් සහ වෙනත් දීමනා කොපමණද;

(iv) එම වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පිහිටුවන ලද අනුබද්ධිත සංවිධානවල නම් සහ ඒවාට අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ කෙසේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0281/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සිංහල භාෂාව පිළිබඳ දැනුමක් නොමැති පුද්ගලයන් රාජ්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීමේදී ඔවුන්ට සහාය දැක්වීම සඳහා වතුකරයේ ප්‍රදේශවලට පහසුකම් සපයන්නන් 500 ක් පත් කළ බවත්;

(ii) මෙම පහසුකම් සපයන්නන් අතරින් 250 කට වැඩි ප්‍රමාණයක් ගුරු වෘත්තිය වැනි රැකියාවලට යෑම සඳහා තම රැකියාව අතහැර ගොස් ඇති බවත්;

(iii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබුවද, එම පුරප්පාඩු තවමත් පුරවා නැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගනු ලබන කාල සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0348/10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පැල්පත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පැල්පත් නිවසේ හිමිකරුගේ / පදිංචි පවුලේ ප්‍රධානියාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) ඉහත නිවාසයන් හි පදිංචි අනුපවුල්වල ප්‍රධානීන්ගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එක් එක් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0125/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලින් දැනට සිදුවන සේවා පිළිබඳව එතුමා සෑහීමට පත්වන්නෙහිද?

(ආ) (i) එම දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කොට්ඨාස මට්ටමින් දැනට ඇති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) අනුමත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේ, ගතවූ කාලය තුළ පවුල් සෞඛ්‍ය සේවා සායන සඳහා සහභාගී වූ ගැබිනි මව්වරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මාස්පතා පෝෂණ මලු ලබාදී තිබේද;

(iii) එම සංඛ්‍යාව කොපමණද;

(iv) පෝෂණ මලු සඳහා ලබාදී ඇති ද්‍රව්‍ය මොනවාද;

(v) එම ගැබිනි මව්වරුන්ට අවශ්‍ය ප්‍රතිකාර නිසි පරිදි ලබාදී තිබේද;

(vi) එම ගැබිනි මව්වරුන් එක් මසකදී පරීක්ෂාවට ලක්කර ඇති වාර ගණන කොපමණද;

(vii) පරීක්ෂා කරන ලද මව්වරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0275/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට අධිකරණ නියෝග මත රඳවා සිටින වයස අවුරුදු 25ට අඩු තැනැත්තන් සංඛ්‍යාව කොපමණද යන්න සහ එය දැනට අධිකරණ නියෝග යටතේ රඳවා සිටින සියලුම තැනැත්තන්ගේ සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වයස අවුරුදු 25 ට අඩු සැකකරුවන් රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් නියම කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය සකස් වී ඇත්තේ හුදෙක් විපාක

විදීමට සැලැස්වීමට වඩා, වත්මන් සමාජ අවශ්‍යතාවයන් සහ ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය පදනම් කොට ගෙනද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වයස අවුරුදු 25ට අඩු තැනැත්තන් රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම හා ඔවුන්ට දඬුවම් නියම කිරීම සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයන් දිරිගන්වන ආකාරයේ පුහුණු වැඩසටහන් "විනිසුරුවරුන් පුහුණුකිරීමේ ආයතනය" විසින් පවත්වනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩසටහන් පවත්වනු නොලැබීමට හේතුව කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් සුදුසු ප්‍රතිකර්ම යෙදීමට එතුමා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?